# මධ්‍යම පළාත් සභාව
# மத்திய மாகாண சபை
# CENTRAL PROVINCIAL COUNCIL

## මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන

මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන ,මිනිස් බල, ද්‍රවිඩ අධ්‍යාපන හා මුස්ලිම් පාසල් කටයුතු, සංස්කෘතික කටයුතු, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, සංචාරක, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය

## மத்திய மாகாண பிரதான மற்றும் கல்வி

நிதியும் திட்டமிடலும், சட்டமும் ஒழுங்கும், உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும், முதலீடு தொடர்பிணைப்பு, ஏனைய அமைச்சுக்களுக்கு கீழ் சேர்த்துக் கொள்ளப்படாத விடயங்கள் தொடர்பான அமைச்சு

## Central Provincial Chief And Education

Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
மாகண சபைக் கட்டத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපැල /மின் அஞ்சல்/E-mail : pcmcentral@gmail.com — වෙබ් අඩවිය/இ.தளம்/ Website : www.cpcm.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය<br>அமைச்சு அலுவலகம்<br>Ministry Office | 081-4481322 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவி செயலாளர்<br>Senior Assistant Secretary | 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | 081-2424935 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0812424938 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සිපීසී/සීඑම්එස්/1/21/PL1/T/2025(2026) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026.02. 26 |

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
මධ්‍යම පළාත් සභාවේ සියලුම පළාත් පාසල් විදුහල්පතිවරු

**මධ්‍යම පළාත් සභාවේ පාසල්වල සේවයේ නියුතු ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ සේවකයින්ගේ වාර්ෂික ස්ථානමාරු - 2026**

2026 වසරේ මධ්‍යම පළාත් සභාවේ පාසල්වල සේවයේ නියුතු ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ සේවකයින්ට අදාළ වාර්ෂික ස්ථානමාරුවීම් සම්බන්ධව අවසන් ස්ථානමාරු නියෝග මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.cm.cp.gov.lk හි පළකර ඇත.

02. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GCP/05/01/43/ප්‍රා.ශි.නො.සේ හා 2026.02.23 දිනැති ලිපිය මඟින් ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ 2026 වර්ෂයට නියමිත වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක වන දිනය 2026.04.02 ලෙස සංශෝධනය කර ඇත. ඒ අනුව ලබා දී ඇති අනුමැතිය අනුව **2026.04.02** දිනට නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.

03. තවද, පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

i. ස්ථානමාරු නියෝග ලද සියලු සේවකයින් වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස් වී ස්ථාන මාරුව ක්‍රියාත්මක වන 2026.04.02 දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගෙන විදුහල්පති මඟින් **2026.04.16** දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය.

ii. ඔබ කලාපයෙහි/විද්‍යාලයෙහි සේවය කරන ස්ථානමාරුවීම් ලබා ඇති සේවකයින් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරී භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි.

iii. ඉහත 2 අනුව කටයුතු කිරීමෙන් පසු යම් සේවකයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති 257-V වගන්තිය අනුව සේවය හැරයෑමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

CamScanner

iv. වාර්ෂික ස්ථානමාරු නියෝග සඳහා අවනත නොවන සේවකයින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31.1.14 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට සිදු වන බවද මෙයින් අවධාරණය කරමි.

v. මේ සමඟ ප්‍රකාශයට පත් කර ඇත්තේ, 2026 වාර්ෂික ස්ථානමාරු අවසන් නියෝග (අභියාචනයන් ද සලකා බැලීමෙන් පසුව) වන අතර, මේ සම්බන්ධයෙන් නැවත නැවතත් මෙම අමාත්‍යාංශය වෙත අභියාචනා ඉදිරිපත් නොකළ යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

M P. L —

මධුපානි පියසේන
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

CS CamScanner